සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

27304

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I

22 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය :......................................

උපදෙස්:

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වේ.
- ✳ **I කොටසට** බහුවරණ ප්‍රශ්න **30** ක් ඇතුළත් වේ. **I කොටසට** පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලිවිය යුතු වේ.
  **සැලකිය යුතුයි : පැන්සලෙන් ලියන පිළිතුරුවලට ලකුණු දෙනු නොලැබේ.**
- ✳ I සහ II කොටස්වලට සපයන ලද පිළිතුරු පත්‍ර එකට අමුණා භාරදිය යුතු වේ.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| I කොටස | 01 - 30 | |
| II කොටස | 1 | |
| | 2 | |
| | 3 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති. ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |

## I කොටස

1. නිරක්ෂ රේඛාවෙන් කැපී යන රටවල් **පහක්** **පමණක්** ඇතුළත්වන වරණය තෝරන්න.
   (1) ඉක්වඩෝරය, බ්‍රසීලය, බොලිවියාව, සයරේ, උගන්ඩාව
   (2) සෝමාලියාව, කොංගෝව, ටැන්සානියාව, පේරු, කොලොම්බියාව
   (3) ඉක්වඩෝරය, කොලොම්බියාව, ගැබොන්, කෙන්යාව, ඉන්දුනීසියාව
   (4) කෙන්යාව, ඉතියෝපියාව, කොංගෝව, සයරේ, ඉන්දුනීසියාව
   (5) බ්‍රසීලය, මලයාසියාව, ඉන්දුනීසියාව, කොංගෝව, සෝමාලියාව (......)

2. ශ්‍රී ලංකාවේ 1:50 000 හු ලක්ෂණ සිතියමක් මගින් කොපමණ භූමි ප්‍රමාණයක් නියෝජනය කෙරේ ද?
   (1) 1200 $km^2$ (2) 1100 $km^2$ (3) 1000 $km^2$ (4) 800 $km^2$ (5) 400 $km^2$ (......)

3. මෙට්‍රික් සිතියම් සුචියට අනුව 1:50 000 සිතියම් කීයක් මගින් ශ්‍රී ලංකා භූමිය ආවරණය කෙරේ ද?
   (1) 120 (2) 102 (3) 100 (4) 92 (5) 72 (......)

4. 1:50 000 සිතියම් නිර්මාණයේදී පාදක කරගන්නා ලද ප්‍රක්ෂේපණය වන්නේ,
   (1) සිලින්ඩරාකාර සමක්ෂේත්‍ර ප්‍රක්ෂේපණයයි. (2) හරස් මර්කේටර් ප්‍රක්ෂේපණයයි.
   (3) සිලින්ඩරාකාර සමුදුර ප්‍රක්ෂේපණයයි. (4) ගෝල්ගේ ප්‍රක්ෂේපණයයි.
   (5) සැන්සන් ෆ්ලැම්ස්ටීඩ් ප්‍රක්ෂේපණයයි. (......)

5. පර්යේෂණයක් සඳහා ගුණාත්මක දත්ත රැස්කිරීමේදී අදාළවන ක්‍රමවේද **පමණක්** ඇතුළත්වන වරණය තෝරන්න.
   (1) සහභාගිත්ව නිරීක්ෂණය, සෘජු නිරීක්ෂණය, අව්‍යිමත් සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය
   (2) අදාළ නියැදියක් තෝරාගැනීම, අව්‍යිමත් සම්මුඛ සාකච්ඡා, සෘජු නිරීක්ෂණ, ප්‍රශ්නාවලි භාවිතය
   (3) උපන්‍යාසයක් පරීක්ෂා කිරීම, සහභාගිත්ව නිරීක්ෂණය, ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය, අව්‍යිමත් සම්මුඛ සාකච්ඡා
   (4) අව්‍යිමත් සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි භාවිතය, සහභාගිත්ව නිරීක්ෂණය, සෘජු නිරීක්ෂණය
   (5) ආකෘති හා න්‍යාය ගොඩනැගීම, සෘජු නිරීක්ෂණය, ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය, සහභාගිත්ව නිරීක්ෂණය (......)

[දෙවෙනි පිටුව බලන්න.


6. සමූහිත දත්ත ඇසුරෙන් මධ්‍යන්‍යය ගණනය කරන සූත්‍රය වන්නේ,

(1) $\dfrac{\sum\left(X_1 - X_2\right)}{N}$ (2) $\dfrac{\sum X_1 + ...X_2}{\sum n}$ (3) $X_0 + \dfrac{(\sum fd)c}{n}$

(4) $\dfrac{\sum fd^2}{n} - X_1 + ...X_2$ (5) $\dfrac{x - fd}{N} + c$ (……)

7. සංඛ්‍යා 25 ක් සහිත දත්ත වැලක මධ්‍යස්ථය දක්වෙනුයේ,
(1) උපරිමයෙහි හා අවමයෙහි එකතුව දෙකෙන් බෙදූවිට ලැබෙන සංඛ්‍යාවෙහි අගයයෙනි.
(2) 13 වන ස්ථානයෙහි පිහිටි සංඛ්‍යාවෙහි අගයයෙනි.
(3) 13 වන හා 14 වන ස්ථානයන්හි පිහිටි සංඛ්‍යා දෙකෙහි එකතුව දෙකෙන් බෙදූවිට ලැබෙන අගයයෙනි.
(4) 12 වන ස්ථානයෙහි පිහිටි සංඛ්‍යාවෙහි අගයයෙනි.
(5) 12 වන හා 13 වන ස්ථානයන්හි පිහිටි සංඛ්‍යා දෙකෙහි එකතුව දෙකෙන් බෙදූවිට ලැබෙන අගයයෙනි. (……)

8. පහත දක්වෙන රූපසටහන පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,




(1) සංඛ්‍යා සමූහයක මධ්‍යන්‍ය හා අපගමන අගයයන්ගේ ව්‍යාප්තියයි.
(2) සංඛ්‍යා වැලක මධ්‍යස්ථය හා අපගමන අගයයන්හි ව්‍යාප්ති රටාවයි.
(3) දත්ත ව්‍යාප්තියක සියලු ම සංඛ්‍යාවන්හි අගයයන් හා සම්මත අපගමනයේ සම්බන්ධතාවයි.
(4) මධ්‍යන්‍යය හා සම්මත අපගමන ඇසුරෙන් සංඛ්‍යාත ව්‍යාප්තියක පැතිරීමයි.
(5) දත්ත ව්‍යාප්තියක විචල්‍යයන්ගේ පැතිරීම හා මධ්‍යන්‍ය අතර පවතින සම්බන්ධතාවයි. (……)

9. භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණයෙන් **පමණක්** නිර්මාණය කරන ලද සිතියම් වර්ගය වන්නේ,
(1) අංකිත සිතියම් (Digital Maps) ය. (2) හස්තික සිතියම් (Manual Maps) ය.
(3) දෙශික සිතියම් (Analogue Maps) ය. (4) මුද්‍රිත සිතියම් (Printed Maps) ය.
(5) ත්‍රිමාන සිතියම් (Three Dimensional Maps) ය. (……)

10. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති (GPS) තාක්ෂණය භාවිතයෙන් ඇඳෙන සිතියමක සුවිශේෂ ලක්ෂණය වන්නේ,
(1) පරිගණකයක ගබඩාකරන ලද දත්ත දෘශ්‍යමානව ඉදිරිපත් කිරීම ය.
(2) භූමියේ යම් කුඩා ප්‍රදේශයක විවිධ භූගෝලීය ලක්ෂණ පැහැදිලි ව ඉදිරිපත් කිරීම ය.
(3) ත්‍රිමාන දර්ශනයක් මගින් භූ ලක්ෂණවල නිරපේක්ෂ පිහිටීම නිවැරදි ව දක්වීම ය.
(4) භූමියේ ඕනෑම ස්ථානයක නිරපේක්ෂ පිහිටීම නිවැරදිව දක්වීම ය.
(5) භූමියේ භූගෝලීය ලක්ෂණවල සාපේක්ෂ පිහිටීම විශ්ලේෂණය කිරීම ය. (……)

11. වායු සංසරණ රටාව පිළිබඳ ව අධ්‍යයනයට මුලින්ම දායකත්වය සැපයූ දේශගුණ විද්‍යාඥයින් තිදෙනකුගේ නම් නිවැරදිව සඳහන් වන්නේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?
(1) හැඩ්ලි, ෆෙරල්, රොස්බි (2) ෆෙරල්, රොස්බි, ට්‍රෙවාතා
(3) රොස්බි, ට්‍රෙවාතා, කෙපන් (4) ට්‍රෙවාතා, හැඩ්ලි, මිලර්
(5) තොන්ත්වේට්, ට්‍රෙවාතා, හැඩ්ලි (……)

12. වායුගෝලීය සංයුතිය නිවැරදිව **අවරෝහණ** පිළිවෙළට දක්වෙන්නේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?

| | | | | |
|---|---|---|---|---|
| (1) | (A) නයිට්‍රජන් | (B) ඔක්සිජන් | (C) මීතේන් | (D) හීලියම් |
| (2) | (A) නයිට්‍රජන් | (B) ඔක්සිජන් | (C) හීලියම් | (D) කාබන්ඩයොක්සයිඩ් |
| (3) | (A) නයිට්‍රජන් | (B) ඔක්සිජන් | (C) මීතේන් | (D) ඕසෝන් |
| (4) | (A) නයිට්‍රජන් | (B) ඔක්සිජන් | (C) ආර්ගන් | (D) කාබන්ඩයොක්සයිඩ් |
| (5) | (A) නයිට්‍රජන් | (B) හීලියම් | (C) කාබන්ඩයොක්සයිඩ් | (D) ඕසෝන් |

(……)

13. ගෝලීය උණුසුම්වීම කෙරෙහි දායකවන ප්‍රධාන හරිතාගාර වායු තුනක නම් ඒවායේ ප්‍රතිශත අනුව **අවරෝහණ** පිළිවෙළට නිවැරදිව දැක්වෙන්නේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?
(1) කාබන්ඩයොක්සයිඩ්, මීතේන්, නයිට්‍රස්ඔක්සයිඩ්
(2) කාබන්ඩයොක්සයිඩ්, ක්ලෝරොෆ්ලෝරෝකාබන්, මීතේන්
(3) ක්ලෝරොෆ්ලෝරෝකාබන්, මීතේන්, නයිට්‍රස්ඔක්සයිඩ්
(4) මීතේන්, නයිට්‍රස්ඔක්සයිඩ්, ජලවාෂ්ප
(5) මීතේන්, නයිට්‍රස්ඔක්සයිඩ්, ආර්ගන් (......)

14. ග්ලැසියර් ඛාදනය මගින් නිර්මාණයවන භූරූප තුනක් සඳහන් වන්නේ පහත දැක්වෙන කවර පිළිතුරෙහි ද?
(1) ලම්බ නිම්න, සර්ක, අරේට (2) සර්ක, අරේට, ඩ්‍රම්ලින්
(3) අරේට, ලම්බ නිම්න, ආංශික මොරේන (4) අරේට, ඩ්‍රම්ලින්, එස්කර
(5) මැටර්හෝර්න්, ඩ්‍රම්ලින්, ආංශික මොරේන (......)

15. කාන්තාරවල ජලයේ ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් වන්නේ පහත සඳහන් කවර භූ රූපය ද?
(1) බහාඩා (2) වාමට කැට (3) යාඩැං (4) සොයිගම (5) හමාඩා (......)


16. පාෂාණවල රසායනික ජීර්ණ ක්‍රියාවලිය නිවැරදිව විස්තර වන්නේ පහත සඳහන් කවර ප්‍රකාශයෙන් ද?
(1) ඛනිජ අංශු ජලය මගින් ද්‍රාවණය වීම
(2) පාෂාණ පැලුම් තුළ ජලය මිදීම
(3) පාෂාණ අතර ශාඛ මුල් විහිදීම
(4) රත්වීම හා සිසිල්වීමෙන් පාෂාණ ඛණ්ඩනය වීම
(5) වැඩි පීඩනය මගින් පාෂාණ බිඳී යාම (......)

17. 1999 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනේ (UNEP) 'ගෝලීය පාරිසරික දැක්ම' වැඩසටහනට අනුව හඳුනාගන්නා ලද ලෝක ව්‍යාප්ත ප්‍රධාන පාරිසරික ගැටලු දෙක වූයේ
(1) වනහරණය හා වෙරළ ඛාදනයයි.
(2) දේශගුණ වෙනස්වීම් හා ජෛව විවිධත්වය විනාශවීමයි.
(3) වායු දූෂණය හා මුහුදු මට්ටම ඉහළයෑමයි.
(4) වනහරණය හා ගංවතුර උවදුරුයි.
(5) පාංශු හායනය හා නියං උවදුරුයි. (......)

18. ජලසම්පත් සංරක්ෂණයේදී ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ සාම්ප්‍රදායික ග්‍රාමීය වැව් වාරිමාර්ග පද්ධතියේ කාර්යභාරය නිවැරදිව දැක්වෙන්නේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?
(1) ජල දූෂණය අවම කිරීම සහ ජලය ආශ්‍රිත ලෙඩ රෝග අවම කිරීම
(2) ජල සම්පත්වල ගුණාත්මක භාවය වැඩි කිරීම හා ආරක්ෂා කිරීම
(3) ප්‍රතිලාභීන්ගේ අවම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ජලය ගබඩා කිරීම
(4) ජලය ප්‍රශස්ත මට්ටමින් බෙදා හැරීම හා නාස්තිය වැළැක්වීම
(5) ප්‍රතිලාභීන් විසින්ම ප්‍රශස්ත මට්ටමින් ජලය භාවිත කිරීම සඳහා ජලය ගබඩා කිරීම (......)

19. ශ්‍රී ලංකාවේ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යයක් වනුයේ,
(1) ග්‍රාමීය ප්‍රජාව වෙත ස්වාභාවික විපත් කළමනාකරණය පිළිබඳ දැනුම බෙදා දීමයි.
(2) නාගරික ප්‍රදේශවල පරිසර හිතකාමී සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමයි.
(3) නව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර පරිසර බලපෑම් තක්සේරු වාර්තා සලකා බැලීමයි.
(4) පාරිසරික වැදගත්කමක් ඇති ප්‍රදේශ "ආරක්ෂිත ප්‍රදේශ" ලෙස ප්‍රකාශයට පත්කිරීමයි.
(5) ප්‍රාදේශීය මට්ටමේ පරිසර සංවිධාන ලියාපදිංචි කිරීමයි. (......)

20. කිසියම් පරිසර පද්ධතියක පරපෝෂිතයන්ගේ ප්‍රශස්ත මට්ටම නිවැරදිව පෙන්නුම් කෙරෙන්නේ පහත සඳහන් කවර පිරමීඩයෙන් ද?



සංඛ්‍යා පිරමීඩය (1) | සංඛ්‍යා පිරමීඩය (2) | ශක්ති පිරමීඩය (3) | ජෛව ස්කන්ධ පිරමීඩය (4) | ශක්ති පිරමීඩය (5) (......)

21. පුම්තිරි අනුපාතය නම් කිසියම් ජන සංඛ්‍යාවක,
(1) ස්ත්‍රීන් 1000 කට පුරුෂයින් සංඛ්‍යාවයි.
(2) පුරුෂයින් 100 කට ස්ත්‍රීන් සංඛ්‍යාවයි.
(3) පුරුෂයින් 1000 කට ස්ත්‍රීන් සංඛ්‍යාවයි.
(4) ස්ත්‍රීන් 100 කට පුරුෂයින් සංඛ්‍යාවයි.
(5) වයස අවුරුදු 15-39 අතර ස්ත්‍රීන් 100 කට පුරුෂයින් සංඛ්‍යාවයි. (......)

මෙතැනින් කපන්න


22. පහත සඳහන් ඒවා අතුරෙන් හරිත විප්ලවයට අදාළවන නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) වන ආවරණයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා එමගින් විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනුණි.
(2) එය තනි සිද්ධියක් නොව නොකඩවා පවතින වෙනස්වීමේ ක්‍රියාවලියකි.
(3) එය IR35 යන 'විස්කම් සහල්' වර්ගය නිපදවීමට දායක විය.
(4) වර්ෂ 2000 වන විට, දකුණු ආසියාවේ වී වගා කළ බිම්වලින් 98% පමණ වැඩි ඵලදායි බීජ වර්ග වගා කරනු ලැබීය.
(5) එය මෙක්සිකෝවෙන් ආරම්භ වී 1970 ගණන්වලදී උප සහරා අප්‍රිකාව හරහා පැතිරිණි. (......)

23. පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ ආහාර පිසීම සඳහා බහුලව භාවිත කරනු ලබන බලශක්ති මූලයන් අවරෝහණ පිළිවෙළට දක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) LP ගෑස්, විදුලි බලය, දර
(2) LP ගෑස්, දර, ජීව වායු
(3) භූමිතෙල්, LP ගෑස්, විදුලි බලය
(4) දර, විදුලි බලය, LP ගෑස්
(5) දර, LP ගෑස්, භූමිතෙල් (......)

24. 2009-2010 කාල පරිච්ඡේදය තුළ, තෝරාගත් රටවල් හතරක ඛනිජ තෙල් නිෂ්පාදනය (දිනකට බැරල් 1000 ක් ලෙස) පහත දක්වේ.
(A) 8 450 (B) 3 920 (C) 2 325 (D) 2 165
පහත සඳහන් ඒවා අතුරෙන් මෙම සංඛ්‍යාවලට අදාළ රටවල නම් නිවැරදිව දක්වෙන්නේ කවර පිළිතුරෙහි ද?
(1) (A) සවුදි අරාබිය (B) ඉරානය (C) අබුඩාබි (D) කුවේට්
(2) (A) ඉරාකය (B) සවුදි අරාබිය (C) ඉරානය (D) කුවේට්
(3) (A) සවුදි අරාබිය (B) කුවේට් (C) බහරේන් (D) ඉරාකය
(4) (A) ඉරානය (B) ඉරාකය (C) කුවේට් (D) බහරේන්
(5) (A) ඉරානය (B) අබුඩාබි (C) කුවේට් (D) ඉරාකය (......)

25. යකඩ නිෂ්පාදනයේ "ජාතියේ එන්ජිම" ලෙස, ඕස්ට්‍රේලියාවේ හඳුන්වනු ලබන ප්‍රදේශය වනුයේ,
(1) දකුණු ඕස්ට්‍රේලියාවේ වයාලියා ප්‍රදේශයයි.
(2) බටහිර ඕස්ට්‍රේලියාවේ පිල්බරා ප්‍රදේශයයි.
(3) ක්වීන්ස්ලන්ත ප්‍රදේශයයි.
(4) නිව් සවුත් වේල්ස්යයි.
(5) කාපෙන්ටේරියා බොක්ක අවට පිහිටි උතුරු ප්‍රාන්තයයි. (......)

26. ඉන්දියාවේ වැදගත් කාර්මික මධ්‍යස්ථාන හතරක් A, B, C සහ D යනුවෙන් සපයා ඇති සිතියමෙහි දක්වා ඇත. ඒවායේ නම් නිවැරදිව සඳහන් කර ඇත්තේ කවර පිළිතුරෙහි ද?




(1) (A) ඉන්දෝර් (B) ජැම්ෂෙඩ්පූර් (C) බෙංගලාරු (D) හයිදරබාද්
(2) (A) භිලායි (B) නාග්පූර් (C) ඉන්දෝර් (D) හයිදරබාද්
(3) (A) ජැම්ෂෙඩ්පූර් (B) නාග්පූර් (C) බෙංගලාරු (D) රූර්කෙලා
(4) (A) අහමදබාද් (B) භද්‍රාවතී (C) භෝපාල් (D) නාග්පූර්
(5) (A) අහමදබාද් (B) ජැම්ෂෙඩ්පූර් (C) භද්‍රාවතී (D) නාග්පූර් (......)

27. ශ්‍රී ලංකා වාර්ෂික මහ බැංකු වාර්තාවේ සඳහන් පරිදි, 2010 දී කාර්මික ව්‍යවසායයන් වැඩි සංඛ්‍යාවක් පිහිටුවා ඇති දිස්ත්‍රික්ක (කොළඹ හැර) අවරෝහණ පිළිවෙළට සඳහන් කර ඇත්තේ කුමන පිළිතුරෙහි ද?
(1) ගම්පහ, කුරුණෑගල, ගාල්ල
(2) ගාල්ල, කුරුණෑගල, කළුතර
(3) ගම්පහ, ගාල්ල, කළුතර
(4) ගම්පහ, කළුතර, ගාල්ල
(5) කළුතර, කෑගල්ල, කුරුණෑගල (......)

28. එක්සත් ජාතීන්ගේ ජනාවාස කේන්ද්‍රයෙහි (UN-Habitat) 2008 වර්තාවට අනුව, 2025 වන විට දැවැන්ත නගර ධූරාවලියෙහි පළමුවැනි, දෙවැනි හා තුන්වැනි තරාවන් කරා එළඹෙතැයි ප්‍රක්ෂේපණය කර ඇති දැවැන්ත නගර තුන පිළිවෙළින් දක්වෙනුයේ කුමන වරණයෙහි ද?
(1) ටෝකියෝ, මුම්බායි, මෙක්සිකෝ සිටි
(2) මෙක්සිකෝ සිටි, නිව්යෝර්ක් - නිවාර්ක්, සාඕ පවුලෝ
(3) ටෝකියෝ, මුම්බායි, දිල්ලිය
(4) ඩැකා, මෙක්සිකෝ සිටි, ටෝකියෝ
(5) ටෝකියෝ, දිල්ලිය, ඩැකා (......)

29. "යුරෝපීය ආර්ථික ප්‍රජාව" (EEC) යන නාමය "යුරෝපීය සංගමය" ලෙස වෙනස් කරනු ලැබුවේ,
(1) 1990 දී ය. (2) 1991 දී ය. (3) 1992 දී ය. (4) 1993 දී ය. (5) 1994 දී ය. (......)

30. බ්‍රික්ස් (BRICs) නමින් හඳුන්වනු ලබන, මෑතකදී සහයෝගීතා ගිවිසුමක් ඇතිකරගත් රටවල් වනුයේ,
(1) බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය ය.
(2) බ්‍රසීලය, රුමේනියාව, ඊශ්‍රායලය, කැනඩාව ය.
(3) බංග්ලාදේශය, රුසියාව, අයර්ලන්තය, චීනය ය.
(4) බංග්ලාදේශය, රුවන්ඩාව, ඉන්දුනීසියාව, චැඩ් ය.
(5) බල්ගේරියාව, රුසියාව, ඉරානය, කොලොම්බියාව ය. (......)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத்
Department of Examinations, Sri Lanka Department **Department of Examinations, Sri Lanka** Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2012**

**නව නිර්දේශය**
**புதிய பாடத்திட்டம்**
**New Syllabus**

භූගෝල විද්‍යාව I
புவியியல் I
**Geography I**

**22 S I**

27304

**උපදෙස්:**

- **පළමුවෙනි** ප්‍රශ්නයටත්, දෙක හා තුන ප්‍රශ්නවලින් **එකක්** තෝරාගෙන **ප්‍රශ්න දෙකකට පමණක්** පිළිතුරු සපයන්න.
- 1:50 000 මහියංගනය භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් හා ප්‍රස්තාර කඩදාසියක් ඔබට සපයා ඇත.

## II කොටස

1. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50 000 පරිමාණයේ මහියංගනය භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය මීටර් 20 කි. මෙම සිතියම පදනම් කර ගනිමින් පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සැලකිය යුතුයි:**

- **පිළිතුරු සිතියමෙහි ලිවිය යුතු නොවේ.**
- ප්‍රශ්න අංකය සහ අදාළ උපකොටස්වල අංක පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
- සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු **නොවේ.**

(i) ප්‍රදේශයේ උන්නතාංශයෙන් වැඩි ම ත්‍රිකෝණමිතික ස්ථානයේ සහ පහළ ම තැන්උස දක්වන ලක්ෂ්‍යයේ උන්නතාංශ මට්ටම් හැඳිනගෙන සිතියම් ප්‍රදේශයේ උන්නතාංශීය පරාසය දක්වන්න. (ලකුණු 01 යි.)

(ii) A සිට B දක්වා ඇඳ ඇති රේඛාව ඔස්සේ භූමියේ හරස්කඩක් ඇඳ දක්වන්න. (ලකුණු 03 යි.)

(iii) ඉහත (i) හා (ii) ප්‍රශ්නවලට ඔබ සැපයූ පිළිතුරු ද උපයෝගී කරගනිමින්, අංක 1 චතුරස්‍රය තුළ භූවිෂමතා ලක්ෂණ 4 ක් හා ජලවහන ලක්ෂණ 3 ක් හැඳිනගෙන එම චතුරස්‍රය තුළ දක්වෙන ප්‍රදේශයේ භූවිෂමතාව හා ජලවහනය පිළිබඳ විශ්ලේෂණයක් කරන්න. (ලකුණු 07 යි.)

(iv) සොරබොර වැවේ හැඩය හා විශාලත්වය තීරණය කිරීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන සමෝච්ච රේඛාව කුමක් ද? (ලකුණු 01 යි.)

(v) ප්‍රදේශයේ වී ගොවිතැන සඳහා ජලසම්පාදනය කරන ප්‍රධාන මූලාශ්‍ර **දෙක** හැඳිනගෙන දක්වන්න. (ලකුණු 01 යි.)

(vi) සුවිශේෂ උදාහරණ දක්වමින් ප්‍රදේශයේ ජල සම්පාදනය හා වී වගාව සඳහා භූමිය පරිභෝග කර ඇති ආකාරය අතර පවතින සම්බන්ධතාව සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)


(vii) ප්‍රදේශයේ කෘෂිකාර්මික ආර්ථිකය නංවාලීම සඳහා අවශ්‍ය සේවා සැපයීම සඳහා මහියංගනය නගරයේ පිහිටුවා ඇති ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 01 යි.)

2. (i) නව සිතියම් විද්‍යාවේ වර්ධනයට භූගෝලීය තොරතුරු පද්ධති (GIS) ක්‍රමවේද භාවිතයෙන් ලැබෙන දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)


(ii) දුරස්ථ සංවේදන ශිල්පීය ක්‍රම යොදාගෙන රැස් කරන ප්‍රධාන දත්ත වර්ග **තුන** මොනවා ද? (ලකුණු 03 යි.)

(iii) ඉහත (ii) හි ඔබ සඳහන් කරන ලද දත්ත වර්ග යොදා ගෙන, භූගෝලීය තොරතුරු පද්ධති ක්‍රමවේද භාවිතයෙන් සිතියම් නිර්මාණයේදී ඇති වාසි **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි.)


(iv) දෛශික සිතියමක් අංකික සිතියමක් බවට පත්කිරීමේ ප්‍රධාන පියවර තුන පහත දක්වේ.



(A)




(B)




(C)

මෙම පියවර තුන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි.)

(v) අංකිත සිතියමක් මගින් කළහැකි කාර්යයන් **හතරක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි.)

3. 2004 වසරේ සිට 2011 වසර දක්වා ශ්‍රී ලංකාවේ ගම්පහ හා මොණරාගල දිස්ත්‍රික්ක දෙකෙහි මහ කන්නයේ වී නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්වලින්) **අංක 01** වගුවෙහි දක්වේ.

**අංක 1 වගුව**

| වර්ෂය | මහ කන්නයේ වී නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්වලින්) | |
|---|---|---|
| | ගම්පහ | මොණරාගල |
| 2004/2005 | 27 460 | 60 780 |
| 2005/2006 | 29 869 | 64 932 |
| 2006/2007 | 21 551 | 94 439 |
| 2007/2008 | 27 714 | 99 446 |
| 2008/2009 | 30 430 | 58 892 |
| 2009/2010 | 36 560 | 118 331 |
| 2010/2011 | 33 905 | 122 027 |

මූලාශ්‍රය : ජන සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - 2011

(i) **අංක 01** වගුවේ දත්ත භාවිතයෙන් ගම්පහ හා මොණරාගල දිස්ත්‍රික්ක දෙකෙහි 2004 සිට 2011 දක්වා කාලයේ මහ කන්නයේ වී නිෂ්පාදනයෙහි
(අ) මධ්‍යන්‍යය
(ආ) මධ්‍යන්‍යයෙහි සිට සෑම විචල්‍යයටම ඇති අපගමනය
(ඉ) මධ්‍යන්‍ය අපගමනය
(ඊ) සම්මත අපගමනය
ගණනය කරන්න. (ලකුණු 08 යි.)

(ii) **අංක 01** වගුවෙහි දත්ත භාවිතයෙන්, ගම්පහ හා මොණරාගල දිස්ත්‍රික්ක දෙකෙහි වී නිෂ්පාදනයෙහි කාලික විචල්‍යතා දැක්වීම සඳහා අපගමන ප්‍රස්තාර **දෙකක්** නිර්මාණය කරන්න. (ලකුණු 08 යි.)

(iii) ගම්පහ හා මොණරාගල යන දිස්ත්‍රික්ක දෙකෙහි වී නිෂ්පාදනයෙහි මධ්‍යන්‍යය හා මධ්‍යන්‍යයේ සිට අපගමන පදනම් කරගෙන අවකාශීය හා කාලික වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)


***

| 22 | I |
|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2011 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2011

භූගෝල විද්‍යාව I (II කොටස) (ප්‍රායෝගික භූගෝල විද්‍යාව)
புவியியல் I (பகுதி II) (செய்முறைப் புவியியல்)
Geography I (Part II) (Practical Geography)

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus




I : 50 000

සමෝච්ච රේඛා අන්තරය මීටර් 20
சமவுயரக்கோடு இடைவெளி 20 மீற்றர்
Contour Interval 20 m

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

27304



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் **இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
Department of Examinations, Sri Lanka **Department of Examinations, Sri Lanka** Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

**නව නිර්දේශය**
**புதிய பாடத்திட்டம்**
**New Syllabus**

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

**22 S II**

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

※ එක් එක් කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ දකුණු, ගිනිකොණ දිග හා නැගෙනහිර ආසියාව දක්වන සිතියම
※ දිස්ත්‍රික් මායිම් සහිත ශ්‍රී ලංකාවේ සිතියම් **තුනක්**
ඔබට සපයා ඇත.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

1. (i) 'ආර්ද්‍ර දේශගුණික පරිසරයක' පාංශු නිර්මාණ ක්‍රියාවලියේ විවිධ අවස්ථා සැකෙවින් විස්තර කරන්න. *(ලකුණු 04 යි.)*
   (ii) පසෙහි භෞතික ගුණාංග **හතරක්** නම්කර, ඒවායින් **එක්** භෞතික ගුණාංගයක් තෝරා එහි කැපී පෙනෙන ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි.)*
   (iii) පාංශු හායනය සහ පාංශු ඛාදනය අතර වෙනස උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි.)*
   (iv) ශ්‍රී ලංකාවේ රතු දුඹුරු පස ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්ක **දෙකක්** සපයා ඇති අංක 01 දරන ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කර, පහත සඳහන් මාතෘකා යටතේ එම පස පිළිබඳ ව විස්තරයක් කරන්න.
      (අ) කැපී පෙනෙන ලක්ෂණ
      (ආ) එම පස ආශ්‍රිතව කෙරෙන මානව කටයුතු *(ලකුණු 06 යි.)*

2. (i) 'දේශගුණ වෙනස්වීම' යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 03 යි.)*
   (ii) 'දේශගුණික මූලිකාංග' **හතරක්** නම් කර ඒවායින් **එකක්** දේශගුණ වෙනස්වීම් හඳුනාගැනීම සඳහා යොදගන්නා ආකාරය උදාහරණ සහිත ව විස්තර කරන්න. *(ලකුණු 06 යි.)*
   (iii) කොපන්ගේ වර්ගීකරණයට අනුව නිවර්තන වර්ෂා දේශගුණයන්හි කැපී පෙනෙන ලක්ෂණ **හතරක්** සැකෙවින් විස්තර කරන්න. *(ලකුණු 06 යි.)*
   (iv) **වගු අංක 1** පදනම් කරගෙන, අදාළ වර්ෂා කාලය හඳුනාගනිමින්, එම කාලයට අදළ ව ශ්‍රී ලංකාවේ වර්ෂාපතනයේ අවකාශීය ව්‍යාප්ති රටාවේ ලක්ෂණ **දෙකක්** සාකච්ඡා කරන්න. *(ලකුණු 05 යි.)*

**වගු අංක 1:**1990 වර්ෂයේ නිශ්චිත මාස හතරක් සඳහා තෝරාගත් මධ්‍යස්ථාන කිහිපයක වාර්තා වී ඇති වර්ෂාපතනය

| මධ්‍යස්ථානය | කොළඹ | රත්නපුරය | අම්පාර | කුරුණෑගල | වටවල | මන්නාරම | බදුල්ල | හම්බන්තොට | අනුරාධපුරය |
|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂාපතනය (mm) | 3 500 | 4 000 | 2 000 | 2 500 | 4 500 | 850 | 2 500 | 1 100 | 1 250 |

3. (i) ලෝකයේ ස්වාභාවික උපද්‍රව **හතරක්** නම් කරන්න. *(ලකුණු 01 යි.)*
   (ii) ස්වාභාවික උපද්‍රව මගින් මානව පරිසරයට සිදුවන අයහපත් බලපෑම් **පහක්** නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. *(ලකුණු 10 යි.)*
   (iii) ස්වාභාවික උපද්‍රව **තුනකට** අදළව ඒවායේ බලපෑම් අවම කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අනුගමනය කර ඇති ක්‍රමෝපායන් **එක** බැගින් නිශ්චිත උදාහරණ සහිතව විස්තර කරන්න. *(ලකුණු 09 යි.)*

4. (i) 'තෙත්බිම් පරිසර පද්ධතිය' නිර්වචනය කරන්න. *(ලකුණු 01 යි.)*
   (ii) පරිසර පද්ධතීන්හි පැවැත්ම උදෙසා තෙත්බිම් මගින් සිදුවන දායකත්වය නිදසුන් **හතරක්** දෙමින් පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි.)*
   (iii) (අ) **අංක 4** ශ්‍රී ලංකා සිතියමෙහි 1 සිට 6 අංකවලින් දක්වෙන 'තෙත්බිම්' හඳුනාගෙන නම් කරන්න. *(ලකුණු 03 යි.)*
      (ආ) ශ්‍රී ලංකාවේ තෙත්බිම් සම්පත්වල ආර්ථික වාසි **තුනක්** සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි.)*
   (iv) ශ්‍රී ලංකාවේ තෙත්බිම්වලට තර්ජනයක් වී ඇති මානව ක්‍රියාකාරකම් **තුනක්** උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි.)*

[දෙවෙනි පිටුව බලන්න.

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5. (i) (අ) භූගෝල විද්‍යා අධ්‍යයනය යනු කුමක් ද? (ලකුණු 01 යි.)

(ආ) එය අනෙක් අධ්‍යයන ක්ෂේත්‍ර අතුරෙන් සුවිශේෂ වන්නේ කෙසේ ද? (ලකුණු 02 යි.)

(ii) "ලෝක ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය භූගෝල විද්‍යාඥයා විසින් තේරුම් ගනු ලබන්නේ විවිධ ප්‍රවේශ ඔස්සේ ය." භූගෝල විද්‍යා අධ්‍යයනයන්හි පැහැදිලි වන ප්‍රවේශ **හතරක්** ඉදිරිපත් කරමින්, මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 08 යි.)

(iii) "ශ්‍රී ලංකාවට දේශපාලන නිදහස ලැබූ කාලයේදී, ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය භූගෝල විද්‍යා භූ දර්ශණයේ කැපී පෙනෙන ලක්ෂණයකි." (ජන සංගණන වාර්තාව, 1946)

(අ) ශ්‍රී ලංකාවට නිදහස ලැබූ කාලයේ සිට, ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය අවම කර ගැනීම සඳහා දායක වූ ප්‍රධාන සංචලන රටා **දෙක** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි.)

(ආ) එම සංචලතා මගින් රටෙහි භූගෝලීය සම්පත් පදනම රටෙහි සංවර්ධනයට උපයෝජනය කළ ආකාරය විස්තර කරන්න. (ලකුණු 06 යි.)

6. මෙම ප්‍රශ්නය යටතේ **6A** සහ **6B** වශයෙන් ප්‍රශ්න දෙකක් ඇතුළත් වේ. ඒවායින් **එකක් පමණක්** තෝරාගත යුතුය.

6A. (i) පහත දක්වෙන ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනාවාස අතුරෙන් **දෙකක** ජන විද්‍යාත්මක ලක්ෂණ සහ ආර්ථික කටයුතු උදාහරණ සපයමින් විස්තර කරන්න.

(අ) පහත රට වියළි කලාපයේ සම්ප්‍රදායික වැව් ගම්මාන

(ආ) මධ්‍යම කඳුරට වතු ජනාවාස

(ඉ) මධ්‍යම කඳුරට නිම්න ගම්මාන (ලකුණු 06 යි.)

(ii) (අ) රැකියා ව්‍යුහය පදනම් කරගෙන **වගු අංක 2 හි** දක්වා ඇති **නාගරික නොවන** ජනාවාස කොටස් **දෙකකට** බෙදා, ඒවා නම් කරන්න. (ලකුණු 01 යි.)

(ආ) ඉහත අංක (ii) (අ) හි ඔබ හඳුනාගත් ඒ ඒ ජනාවාස වර්ගයේ රැකියා ව්‍යුහයේ කැපී පෙනෙන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 05 යි.)

**වගු අංක 2**

ශ්‍රී ලංකාවේ තෝරාගත් **නාගරික නොවන** ජනාවාසවල රැකියා ව්‍යුහය, 2001

| ග්‍රාම නිලධාරි කොට්ඨාශය | රැකියා ව්‍යුහය (ප්‍රතිශතය) | | |
|---|---|---|---|
| | ප්‍රාථමික | ද්විතීයික | තෘතීයික |
| 324 | 7.50 | 25.00 | 67.50 |
| 893 | 95.00 | 1.00 | 4.00 |
| 885 | 88.50 | 6.25 | 6.25 |
| 863 | 94.00 | 2.48 | 3.52 |
| 320A | 13.00 | 35.00 | 52.00 |
| 310A | 11.60 | 25.60 | 62.80 |

මූලය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2001

(iii) ශ්‍රී ලංකාවේ විශාල නගර අවට පිහිටා ඇති ග්‍රාමීය ජනාවාසවල ජන විද්‍යාත්මක හා භූමි පරිභෝග රටාව නාගරිකරණය නිසා වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

6B. (i) **අංක 6** ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර ඇති පහත සඳහන් ස්වාභාවික හා සංස්කෘතික සංචාරක ආකර්ෂණ හඳුනාගෙන නම් කරන්න.

උඩවලවේ අභය භූමිය, අනුරාධපුරය, සීගිරිය, මහනුවර, මීගමුව, උණවටුන, ආරුගම් බොක්ක, පොළොන්නරුව, පාසිකුඩා, ලෝකාන්තය (ලකුණු 05 යි.)

(ii) **වගු අංක 3** හි සපයා ඇති දත්ත **සහ** ඔබේ පසුබිම් දැනීම ප්‍රයෝජනයට ගෙන, ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ **වෙනත් අංශවලට සාපේක්ෂව** සංචාරක කර්මාන්තයේ වැදගත්කම පරීක්ෂා කරන්න. *(ලකුණු 05 යි.)*

**වගු අංක 3**

**ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රවණතා (2009 සහ 2010)**

| **දර්ශක** | **2009** | **2010** |
|---|---|---|
| උපයා ගත් විදේශ විනිමය (%) | 2.8 | 3.8 |
| විදේශ විනිමය උපයන අංශ අතර පිහිටීම (තරාව) | 6 | 5 |
| රාජ්‍ය අංශයට ලැබෙන සෘජු ආදායම (රුපියල් මිලියන) | රු. 2152 | රු. 3219 |
| සේවා නියුක්තිය | | |
| සෘජු | 52071 | 55023 |
| වක්‍ර | 72899 | 77032 |
| මුළු සේවා නියුක්තියේ ප්‍රතිශත වර්ධනය | – | 5.7 |

මූලය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, සංඛ්‍යාන වාර්තාව 2009 හා 2010

(iii) ශ්‍රී ලංකාවේ සංවර්ධනය අඩු ප්‍රදේශය කෙරෙහි සංචාරක කර්මාන්තයේ ආර්ථික හා සමාජ - සංස්කෘතික බලපෑම සාකච්ඡා කරන්න. *(ලකුණු 10 යි.)*

7. (i) දකුණු හා නැගෙනහිර ආසියාතික රටවල මෝටර් රථ නිෂ්පාදනය කරන, පහත සඳහන් ප්‍රධාන නගර **අංක 7** සිතියමෙන් හැඳිනගෙන **ඒවා සිතියමෙහි** නිවැරදි ව නම් කරන්න.

චෙන්නායි, කියෝටෝ, බුසාන්, පුනෙ, උල්සාන්, ටෝකියෝ, ෂැංහයි, ගුඇන්සු *(ලකුණු 04 යි.)*

(ii) පහත දක්වෙන **වගු අංක 4** හි තොරතුරු **හා** ඔබේ පසුබිම් දැනුම ප්‍රයෝජනයට ගනිමින් මෝටර් රථ කර්මාන්තයේ ගෝලීය පිහිටීම් රටාවේ සිදුවී ඇති වෙනස්කම්වල කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි.)*

**වගු අංක 4**

තෝරාගත් රටවල මෝටර් රථ නිෂ්පාදනය

(2000 සහ 2011)

| **රට** | **මෝටර් රථ සංඛ්‍යාව** | |
|---|---|---|
| | **2000** | **2011** |
| චීනය | 2 069 000 | 18 419 000 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 12 800 000 | 8 654 000 |
| ජපානය | 10 141 000 | 8 399 000 |
| ජර්මනිය | 5 521 000 | 6 311 000 |
| දකුණු කොරියාව | 3 115 000 | 4 657 000 |
| ඉන්දියාව | 801 360 | 3 936 000 |

මූලය : මෝටර්රථ නිෂ්පදකයින්ගේ ජාත්‍යන්තර සංවිධානයේ 2012 වාර්තාවෙන් සකස් කරන ලදී.

(iii) **එක්කෝ** චීනයේ **නැතහොත්** ඉන්දියාවේ මෝටර් රථ කර්මාන්තයේ ප්‍රසාරණයට පහත සඳහන් සාධක දයක වූ ආකාරය සාකච්ඡා කරන්න.

(අ) විදේශ සෘජු ආයෝජන හා බද්ධ ව්‍යාපාර

(ආ) ස්වදේශීය හා විදේශීය වෙළඳපොළ

(ඉ) අමුද්‍රව්‍ය හා බලශක්තිය *(ලකුණු 10 යි.)*

8. මෙම ප්‍රශ්නය යටතේ **8A** සහ **8B** වශයෙන් ප්‍රශ්න දෙකක් ඇතුළත් වේ. ඒවායින් **එකක් පමණක්** තෝරාගත යුතුය.

8A. (i) "දියුණුවෙමින් පවතින රටවල ප්‍රාදේශීය සංවිධාන මූලික වශයෙන් අරමුණු කර ගන්නේ ගෝලීයකරණයේ අභියෝගවලට සාර්ථක ලෙස මුහුණ දීමයි." ආසියාවේ වැදගත් ප්‍රාදේශීය සංවිධාන **දෙකකින්** නිශ්චිත උදාහරණ සපයමින්, මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි.)*

(ii) **එක්කෝ** යුරෝපීය හවුලේ (EU) **නැතහොත්** අප්‍රිකානු ආර්ථික කොමිසමේ (ECA) ප්‍රධාන අරමුණු **හතරක්** විමසන්න. *(ලකුණු 08 යි.)*

(iii) "ශ්‍රී ලංකා ආර්ථිකයේ විවිධ අංශවලට තොරතුරු තාක්ෂණය යොදා ගැනීමේදී නොයෙක් අභියෝගවලට මුහුණදීමට සිදු වේ." නිශ්චිත උදාහරණ සපයමින්, පහත දක්වෙන ශීර්ෂ යටතේ මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(අ) කෘෂිකාර්මික අංශය

(ආ) සමාජයීය හා සංස්කෘතික අංශ *(ලකුණු 06 යි.)*

[හතරවෙනි පිටුව බලන්න.

8B. (i) තොරතුරු සන්නිවේදන තාක්ෂණය යනු කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතය නිසා දියුණු හා දියුණුවෙමින් පවතින රටවල් අතර ගෝලීය සමාජ - ආර්ථික විෂමතා වැඩිවෙමින් පවතී දැයි සැකෙවින් විභාග කරන්න. (ලකුණු 04 යි.)

(iii) නිශ්චිත උදාහරණ සපයමින්, තොරතුරු සන්නිවේදන තාක්ෂණය විසින් ගෝලීයකරණ ක්‍රියාවලිය කෙරෙහි කාලීන හා අවකාශීය වශයෙන් සිදු කෙරෙන බලපෑම, පහත සඳහන් ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.

(අ) ආර්ථික ගෝලීයකරණය

(ආ) සංස්කෘතික ගෝලීයකරණය (ලකුණු 08 යි.)

(iv) "ශ්‍රී ලංකා ආර්ථිකයේ ධනාත්මක පරිවර්තනය උදෙසා තොරතුරු තාක්ෂණය මගින් ඇති කරනු ලබන බලපෑම සීමාසහිත ය" යන මතයට ඔබ එකඟ වන්නේ ද? උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

* * *

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II


I කොටස (භෞතික භූගෝල විද්‍යාව)
பகுதி I (பௌதிகப் புவியியல்)
Part I (Physical Geography)

22


II

විභාග අංකය
சுட்டெண்
Index No. ........................

ප්‍රශ්න අංකය
வினா இல
Question No. 1



ප්‍රශ්න අංකය
வினா இல
Question No. 4



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka**


අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2012**

**නව නිර්දේශය**
**புதிய பாடத்திட்டம்**
**New Syllabus**

| | | | |
|---|---|---|---|
| භූගෝල විද්‍යාව II<br>புவியியல் II<br>**Geography II** | II කොටස (මානුෂ භූගෝල විද්‍යාව)<br>பகுதி II (மானிடப் புவியியல்)<br>**Part II (Human Geography)** | **22** | **II** |

ප්‍රශ්න අංකය
வினா இல
**Question No.** **6**

විභාග අංකය
சுட்டெண்
**Index No.** ……………………



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II


II කොටස (මානුෂ භූගෝල විද්‍යාව)
பகுதி II (மானிடப் புவியியல்)
Part II (Human Geography)

22 II

27296

ප්‍රශ්න අංකය / வினா இல / Question No. 7

විභාග අංකය / சுட்டெண் / Index No. ........................



● ප්‍රධාන නගරය / பிரதான நகரம் / Main Centre